# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,495—1965 සැප්තැම්බර් 3 වැනි සිකුරාදා—1965.9.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 637 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | 651 |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | — | අය-වැය ලේඛන .. .. .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. — .. | 641 | ටෙන්ඩර් විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | 642 | මාර්ග කොමිටි දැන්වීම .. .. .. | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | 651 | විවිධ දැන්වීම් .. .. .. | 657 |


[සැලකිය යුතුයි.—මේවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.]

## පළාත් පාලන නිවේදන

එල්.ඩී.—බී 39/52.
ප. පා. දෙ.—ජීඕ. 56/2/1.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දීය,

### ආඥාව

ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු ගම් ප්‍රදේශයේ ගම් සභාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතුයයි ප්‍රකාශයට පත් කරමින් 1964 පෙබරවාරි 6 වැනි දින අංක 13,943 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

9–244—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය.

---

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත පරිදි, (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 14 දින,
කොළඹ දීය.

### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964දී සැප්තැම්බර් 12 වැනි දින අංක 14,168 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙන් සංශෝධිත, වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිටිගල හත්පත්තු දේශීය ආදායම් නිලධාරියාගේ කොට්ඨාශයේ තිරිපිටිය ගම් ප්‍රදේශයේ සීමා පිළිබඳ ආඥාව, එහි "1965 ජූලි 1 වැනි දින" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9-224/1—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත පරිදි, (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 සහ 10 වැනි වගන්ති යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 14 දින,
කොළඹ දීය.

## ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5 සහ 10 වැනි වගන්ති යටතේ සම්පාදිතව, 1964 සැප්තැම්බර් 12 වැනි දින අංක 14,168 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1965 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙන් සංශෝධිත, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තු දේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුඹුක්වැව ගම් ප්‍රදේශය සංස්ථාපනය කිරීම පිළිබඳ ආඥාව, එහි (2) වැනි ඡේදයේ, "1965 ජුලි 1 වැනි දින" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9-224/2—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1964 සැප්තැම්බර් 12 වැනි දින අංක 14,168 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1965 ජනවාරි 8 වැනි දින, අංක 14,287 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් අවසන් වරට සංශෝධිත, කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තු දේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුඹුක්වැව ගම් ප්‍රදේශය, නැවත ඡන්ද කොට්ඨාශවලට බෙදා වෙන් කිරීම පිළිබඳ නිවේදනය, එහි (2) වැනි ඡේදයේ, (අ) සහ (ආ) යන එක් එක් උපඡේදයන්හි "1965 ජුලි 1 වැනි දින" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 14 දින,
කොළඹ දී ය.

9-224/3—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, 1964 සැප්තැම්බර් 12 වැනි දින අංක 14,168 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1965 ජනවාරි 8 වැනි දින, අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් අවසන් වරට සංශෝධිත, කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තු දේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හිරිපිටිය ගම් ප්‍රදේශය නැවත ඡන්ද කොට්ඨාශවලට බෙදා වෙන් කිරීම පිළිබඳ නිවේදනය, එහි (2) වැනි ඡේදයෙහි, (අ) සහ (ආ) යන එක් එක් උපඡේදයේ "1965 ජුලි 1 වැනි දින" යන පාඨය වෙනුවට "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 14 දින,
කොළඹ දී ය.

9-224/4—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් පිළිබඳ ආඥාපනත

(265 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලනය සම්බන්ධ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු 14 දින,
කොළඹ දීය.

## ආඥාව

(265 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1964 සැප්තැම්බර් 12 වැනි දින අංක 14,168 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1965 ජනවාරි 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙන් සංශෝධිත, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුක්වැව සහ හිරිපිටිය ගම් ප්‍රදේශ පිළිබඳ ආඥාව, එහි (1) සහ (2) යන එක් එක් ඡේදයන්හි, "1965 ජුලි 1 වැනි දින" යන පාඨය වෙනුවට, "1966 පෙබරවාරි 1 වැනි දින" යන පාඨය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9-224/5—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

එල්. ජී.—බී. 30/58
ප. පා. කො. —බී/පු/7/20/7

## නගර සභා ආඥාපනත

### 75 (1) වැනි වගන්තිය යටතේ නිවේදනයයි

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 75 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ ආඥාපනතේ 74 වැනි වගන්තියෙහි නියමිත ගොඩනැගිලි සීමාව නිසා ඇති වන බලපෑම් සම්බන්ධයෙන් ඒ. සමරරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රය අනුව, පානදුර නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි නන්දන මාවත නමැති පාරේ ගොඩනැගිලි සීමාව එම පාරේ මැද සිට අඩි විස්ස දක්වා අඩු කිරීමෙන් වෙනස් කරමි.

ආර්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දීය.

9-239 —65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

එල්.ඩී—බී. 30/58
ප. පා. කො.—බීඩී/ප්‍ර/7/20/8

## නගර සහ ආඥපනත

### 75 වැනි වගන්තිය යටතේ නිවේදනයයි

(255 වැනි අධිකාරය වන) නගර සහ ආඥපනතේ 75 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ ආඥපනතේ 74 වැනි වගන්තියෙහි නියමිත ගොඩනැගිලි සීමාව නිසා ඇති වන බලපෑම් සම්බන්ධයෙන් මිරිස්වත්ත ගොඩනැගිලි සමාගමේ ගරු ලේකම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය අනුව, පානදුර නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි තුන්වැනි හරස් වීථියෙන් ඔබ්බට ඇති පටු මගේ ගොඩනැගිලි සීමාව එම පාරේ මැද සිට අඩි විස්ස දක්වා අඩු කිරීමෙන් වෙනස් කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දීය.

9-233—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

ඇල්ඩී.—බී. 31/47.

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

(262 වැනි අධිකාරිය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 84 වැනි වගන්තිය යටතේ පළාත්පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥපනතේ 5 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ අංක 14,450 සහ 1965 ජූලි 13 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවක් අනුව 1966 පෙබරවාරි පළමුවැනි දින සිට මන්නාරම් දිස්ත්‍රික්කයේ බටහිර මාන්තයි ගම් ප්‍රදේශය සඳහා ගම් සභාවක් සංස්ථාපනය කළ යුතුව ඇති හෙයින් ද:

1966 ජනවාරි 31 වැනි දිනට ප්‍රථමයෙන් එකී ගම් සභාවේ සභික වරුන් තෝරා පත් කිරීම පිණිස වූ පළමුවැනි මහා ඡන්ද විමසීම පැවැත්වීමේ කාර්යය සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද;

(262 වැනි අධිකාරිය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මන්නාරම් දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින්—

(අ) තමා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයක ඉහත කී මහා ඡන්ද විමසීමේ කාර්යය සඳහා ඡන්ද ලැයිස්තු පිළියෙල කිරීම ආරම්භ කළ යුතු බව; සහ

(ආ) ගම්සභාවේ නිල කාලය ආරම්භ කිරීමට නියමිත දිනය ගැන සැලකිලිමත් වෙමින්, තමාගේ අභිමතය පරිදි ක්‍රියා කරමින් ඉහත කී මහා ඡන්ද විමසීම පැවැත්වීමේ කාර්යය සඳහා තමා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයන්හි දී යථෝක්ත (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ 22, 26 සහ 38 වැනි වගන්ති වලින් නියම කෙරෙන කටයුතු බවද

මෙයින් අණ කර ප්‍රකාශ කරනු ලැබේ.

9-3—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1963 ජූනි මස 21 වන දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරන ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වන කොටස මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට සම්මත කර ගැනීමට, මොනරාගල ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ඇම්. ආර්. පී. පුංචිබණ්ඩා,
මොනරාගල ගම් සභාවේ සභාපති තැන.

1965 ජූනි මස 23 වැනි දින,
මොනරාගල ගම්සභා කාර්යාලයේදීය.

9-237—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

261 අධිකාරය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ එරාවූර් දකුණ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10.517 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු 7 වැනි දින අංක 10.560 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක I සිට XXXVII (I හා XXXVII ද ඇතුලත්ව) දරන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට එරාවූර් දකුණ ගම් සභාව විසින් 261 අධිකාරය වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ජී. සින්නතම්බි,
සභාපති.

ගම්සභා කාර්යාලය,
ආරුම්ගතාන් කුඩි,
1965.7.17.

9-236—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වන දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙහි පළ වූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වන කොටස, මෙම යෝජනාව ගැසට් පත්‍රයෙහි පළවන දින සිට සම්මත කර ගැනීමට, කිරම ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරිය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ආර්. ඇන්. මාටින්,
කිරම ගම් සභාවේ සභාපති.

ගම් සභා කාර්යාලය,
කිරම,
65.8.9 දින.

9–221—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## දැන්වීමයි

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 55 (3) දරණ වගන්තිය යටතේ මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව, මාතර නගරයේ විශේෂ කොමසාරිස් තැන්පත්, හෙට්ටිආරච්චිගේ පියදාස අබේවර්ධන වන මම, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරයේ දැක්වෙන මාතර නගරයේ පාරවල නම් එහි දෙවැනි තීරයේ සඳහන් පරිදි වෙනස් කළ බවත් අළුතින් යොදන නම් 65.9.1 වැනි දින සිට භාවිතා කරන බවත් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

එච්. ෆ්. පී. අභයවර්ධන,
මාතර නගරයේ විශේෂ කොමසාරිස්.

1965 අගෝස්තු මස 23 වැනිදා,
මාතර විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය |
|---|---|
| දැනට භාවිතා කරන නම | යෝජිත නම |
| (1) බ්‍රෝඩ්වේ පාර ... | (1) අනගාරික ධම්පාල මාවත |
| (2) අනගාරික ධම්පාල මාවත ... | (2) සරම් මුදලි මාවත |

9–207—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## ගම්සභා ආඥා පනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපණතේ 13 (1) වැනි වගන්ති යෙන් මා වෙත පැවරුණු බලයේ ප්‍රකාර, ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතුබන්ඩාර සමරකෝන් වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ කිවුලේගෙදර ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශයේ සභික ආර්. ඇම්. ගුනපාල රත්නායක මහතා පිළිවෙලින් පැවත්වුණු ගම්සභා රැස්වීම් තුනකට වැඩි ගණනකට සභාවට දැනුම්දීමක් නොකර නොපැමිණි බව ගැන සෑහීමට පත්වී, බදුල්ල දිස්ත්‍රික්කයේ කිවුලේගෙදර ගම්සභාවේ අංක 2 දරණ කොට්ඨාශයේ සභික ආර්. ඇම්. ගුනපාල රත්නායක මහතා, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට තම සභික ධුරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. බී. සමරකෝන්,
ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1965 අගෝස්තු 24 දින, බදුල්ලේ දීය.

9–234—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## ගම්සභා ආඥපනත්

### ගම්සභා ආඥ පනතේ 17 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර උතුරු (දූපත්) කොටසේ පළාත් පාලන සහකාර කොමසාරිස් සිවසුබ්‍රමානියම් චින්නයානන් ගුරු මානිකවාසගර් වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම්සභාවේ සභාපති පත්කර ගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයේ දී 3 වැනි තීරුවේ සඳහන් වේලාවේදී 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේදී, රැස්වීම මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇස්. පී. මානිකවාසගර්,
සහකාර පළාත් පාලන කොමසාරිස් තැන,
උතුරු කොට්ඨාශය (දූපත්).

1965 ක්වූ අගෝස්තු මස 24 වැනි දින,
යාපනේ උතුරු (දූපත්) පළාත් පාලන සහකාර
කොමසාරිස් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| 1 වැනි තීරුව | 2 වැනි තීරුව | 3 වැනි තීරුව | 4 වැනි තීරුව |
|---|---|---|---|
| ගම් සභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| පුන්ඩතරිප්පු ... ... | 11.9.65 ... | පෙරවරු 10 ... | ගම්සභා කාර්යාලය |

9–92—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## බිබිල ගම්සභාව

### බිබිල ගම් ප්‍රදේශයේ, බිබිල නගරය ගොඩනැගිලි සෑදූ දියුණු ගම්මණ්ඩියක් ලෙස ප්‍රකාශ කිරීම

පහත දැක්වෙන උප ලේඛණයේ සඳහන් මායිම් වලට සීමාවූ බිබිල ගම් ප්‍රදේශයේ බිබිල නගරය දියුණු ගම් මණ්ඩියක් වශයෙන්, ගම්සභා ආඥාපනතේ 257 වෙනි අධිකාරයේ 37 (2) (ඒ) වගන් තිය යටතේ ඌව පළාතේ සහකාර පළාත් පාලන කොමසාරිස් තුමාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පමුණුවා ඇති බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛණය

උතුරට :—හෙවෙල්වෙල ගම්සභා පාරේ මධ්‍ය රේඛාව බදුල්ල-මඩකලපුව ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ මහා මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂයේ සිට යාර 400 ක් උතුරු දෙසට අඳින ලද ලම්භ රේඛාවේ උතුරු කෙළවරේ සිට බිබිල-මහියංගණ ප්‍ර. වැ. දෙ. මහා මාර්ගයේ මධ්‍ය රේඛාවට යාර 400 ක් බටහිරින් පිහිටි ලක්ෂය දක්වා බදුල්ල-මඩකලපු පාරේ මධ්‍ය රේඛාවට යාර 400 ක් උතුරින් හා සමාන්තරව නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින්ද, එතැන් පටන් බිබිල-මහියංගණ මග පාරේ මධ්‍ය රේඛාවේ

1 වෙනි සැකැසුම පිහිටි ලක්‍ෂයට යාර 400 ක් බටහිරින් පිහිටි ලක්‍ෂය දක්වා එකී මහියන්ගණ පාරේ මධ්‍ය රේඛාවට යාර 400 ක් බටහිරින් හා සමාන්තරව උතුරු දෙසට අඳින ලද රේඛාවකින් ද, එතැන් පටන් නැගෙනහිර දෙසට යාර 800 ක් දුරට අඳින ලද රේඛාවකින් ද, එතැන් පටන් බදුල්ල-මඩකලපු පාරේ මධ්‍ය රේඛාවට යාර 400 ක් උතුරින් අඳින ලද සමාන්තර රේඛාවක් හමුවනතෙක් දකුණු දෙසට හා බිබිල-මහියන්ගණ පාරේ මධ්‍ය රේඛාවට සමාන්තරව අඳින ලද රේඛාවකින් ද එතැන් පටන් හබ්බුන්නා කඳුරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් එකී බදුල්ල-මඩකලපුව පාරේ මධ්‍යම රේඛාවට සමාන්තරව නැගෙනහිර දෙසට අඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට: අවසාන වරට සඳහන් ලක්‍ෂයේ සිට එකී බදුල්ල-මඩකලපු පාරේ මධ්‍ය රේඛාවට යාර 400 ක් දකුණින් හා සමාන්තරව අඳින ලද එකී හබ්බුන්නා කඳුරේ මධ්‍ය රේඛාව හමුවන ලක්‍ෂය දක්වා දකුණු දෙසට එකී හබ්බුන්නා කඳුරේ මධ්‍ය රේඛාවෙන් ද;

දකුණට: අවසාන වරට සඳහන් ලක්‍ෂයේ සිට බිබිල-මොනරාගල පාරේ මධ්‍ය රේඛාවට යාර 400ක් නැගෙනහිරින් පිහිටි ලක්‍ෂය දක්වා බදුල්ල-මඩකලපු පාරේ මධ්‍ය රේඛාවට යාර 400ක් දකුණින් හා සමාන්තරව බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ද එතැන් පටන් බිබිල-මොනරාගල පාරේ මධ්‍ය රේඛාවේ 1 වැනි සැකැසුමට යාර 400 ක් නැගෙනහිරින් පිහිටි ලක්‍ෂය දක්වා එකී මොනරාගල පාරේ මධ්‍ය රේඛාවට සමාන්තරව දකුණු දෙසට අඳින ලද රේඛාවකින් ද, එතැන් පටන් යාර 800 ක් බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ද එතැන් පටන් බදුල්ල-මඩකලපු පාරේ මධ්‍ය රේඛාවට යාර 400 ක් දකුණින් පිහිටි ලක්‍ෂය දක්වා, එකී මොනරාගල පාරේ මධ්‍ය රේඛාවට යාර 400ක් බටහිරින් හා සමාන්තරව අඳින ලද රේඛාවකින් ද එතැන් පටන් හෙවෙල්වල ගම්සභා පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් එකී මඩකලපුව පාරේ මධ්‍ය රේඛාවට යාර 400 ක් දකුණින් හා සමාන්තරව අඳින ලද රේඛාවකින් ද;

බටහිරට: අවසාන වරට සඳහන් ලක්‍ෂයේ සිට එකී ගම්සභා පාරේ මධ්‍ය රේඛාව දිගේ බදුල්ල-මඩකලපුව පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් අඳින ලද රේඛාවකින් ද, එතැන් පටන් උතුරු මායිමේ බටහිර කෙළවර දක්වා උතුරට අඳින ලද රේඛාවකින් ද සමන්විත වේ.

ආර්. එච්. ඇන්ඩර්සන් සිල්වා,
බිබිල ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු 24 වෙනි දින,
බිබිල ගම්සභාකාර්යාලයේ දීය.

9–223—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ පමුණුගම ගම්සභාව

1957 ගෝඝාතක ආඥාපනත

1957 ගෝඝාතක ආඥාපණතේ 13, අ (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර නිසි බලධාරියාවූ, කොළඹ දිස්ත්‍රික්කයේ පමුණුගම ගම්සභාවේ සභාපති, පී. බී. ඒ. ජෝශප් වන මම, 1965 දෙසැම්බර් මස 31 වැනි දාසින් අවසන්වන කාල සීමාව තුළ පමුණුගම ගම්සභා ප්‍රදේශය ඇතුළත මස් පිණිස මීහරක් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

පී. බී. ඒ. ජෝශප්,
පමුණුගම ගම්සභාවේ සභාපති කැන.

1965 අගෝස්තු මස 24 වෙනි දින,
පමුණුගම ගම්සභා කාර්යාලය,
පමුණුගම.

9–240—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

II වැනි ශ්‍රේණියේ ගණන් තබන්නන්ගේ තනතුරු

ඉහත සඳහන් තනතුරුවලට පත්කිරීම සඳහා පහත නම් සඳහන් අපේක්ෂකයින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

| නම | | ලිපිනය |
|---|---|---|
| 1. ප්‍රනාන්දු, එම්. ඒ. | ... | සාමාන්‍ය පෙල ලිපිකරු, කොළඹ නා. ස. |
| 2. මොහොට්ටි, එම්. | ... | සාමාන්‍ය පෙල ලිපිකරු. විශේෂ කොමසාරිස් කාර්යාලය, මාතර. |
| 3. කස්තුරිආරච්චි, ඒ. | ... | හන්වැල්ල. |
| 4. සමිදෙන්, ඊ. බී. | ... | සාමාන්‍ය පෙල ලිපිකරු, කොළඹ නා.ස. |
| 5. වික්‍රමබණ්ඩා, ඒ. එම්. | ... | අංක 149, මාදන්වල, හගුරන් කෙත. |

මෙම අපේක්ෂකයින්ට විභාග පත්වීම් ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. වීරසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 25 දින,
තැ. පෙ. 530, කොළඹ.

9–218—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## පළාත් පාලන සේවය

යතුරු ලේඛකයින්ගේ සේවයට බඳවා ගැනීමේ සිංහල විභාගය—1965. 5. 8.

'බී' ප්‍රදේශය

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් යතුරු ලේඛකයින්ගේ සේවයට (සිංහල) පත්කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ:—

| නම | | ලිපිනය |
|---|---|---|
| 1. දේවසිංහ, ඩී. ඇම්. ඩබ්ලිව්. | ... | අලුත්කඩේ, කවුඩවත්ත, කුරුණෑගල. |
| 2. ධම්මවංශ, ඒ. | ... | 2/45, බණ්ඩාරනායක මාවත, පොල්ගහවෙල. |
| 3. ගජනායක විමලාවතී (මෙනෙවිය) | ... | ගොරඹියවත්ත, වැලිකේමුල්ල, බදුල්ල. |
| 4. හේරත්, එච්. ඇම්. පී. බී. | ... | 'ජයන්ති', දෙවිරගම්පල, මාවනැල්ල. |
| 5. ඉඹුලගොඩ, ඩී. ඊ. (මෙනෙවිය) | | 49, කොළඹ පාර, වෙළුපේ, රත්නපුරය. |
| 6. ජයසුමන, ඇම්. ඩබ්ලිව්. | ... | ප්‍රාදේශිය මාර්ග ඉංජිනේරු කාර්යාලය, ඩවුනියාව. |
| 7. කාන්තිරත්න හාමිනේ, ඩබ්ලිව්. ජී. (මෙනෙවිය) | ... | තිබ්බොටුවාව, ඇහැලියගොඩ. |
| 8. පුංචිරාළහාමි, ඒ. ඇම්. | ... | රත්මල්ගොඩ, පොල්ගහවෙල. |
| 9. සිම්යොන්, ඇම්. ඩී. | ... | බටහිර කලටුවාව, හේනසින්න, දුවස්පිටිය. |
| 10. සෝමාවතී, ආර්. ඈර්. (මෙනෙවිය) | ... | යටිවෝගොඩ, අඹන්පිටිය. |
| 11. වීරරත්න, ඩී. | ... | ඩී. ප්‍රේමරත්න සහෝදරයෝ බාදේ, රෝහල හන්දිය, පොළොන්නරුව. |

| නම | ලිපිනය |
|---|---|
| 12. වීරසිංහ, ඇම්. ... | කෝම්පල, කුරුණෑගල. |
| 13. විජේසූරිය, ආර්. වී. එම්. (මෙනෙවිය) ... | උඩවත්ත, විහාරගොඩ, බදුල්ල. |
| 14. යසවතී, ඇස්. ඩී. (මෙනෙවිය) | ඇම්. ඩී. ඒ. ගුණතිලක මහතා බාරේ, මඩල, ඇල්ලගාව. |

65.3.26 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකරන ලද ඉහත සඳහන් විභාගය පිළිබඳ ගැසට් නිවේදනයේ 1 (බී) ඡේදය අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් දෙදෙනා පත් කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරා ගෙන ඇත:—

| නම | ලිපිනය |
|---|---|
| 15. මද්දුම බණ්ඩා, ඇස්. ඊ. ... | කාර්යාල කාර්ය සහායක, කුළු ගම්මාන සියපත්තු ගම්සභාව. |
| 16. සෙනෙවිරත්න, ඩී. ජේ. ... | කාර්යාල කාර්ය සහායක, දිඹුල ගම්සභාව. |

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම ලබා දීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 25 දින,
තැ. පෙ. 530,
කොළඹ.

9–219—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී 25/45

## තංගල්ල නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 හා 157 වැනි වගන්තිය යටතේ තංගල්ල නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1965.8.14 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

පහත දැක්වෙන ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර විශයෙන් සැලකිය යුතුය:—

ගැලුම් 50 ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම.

තලතෙල් නිපදවීම.

ගිනිකූරු නිපදවීම.

ගෝනි ගබඩා කිරීම.

විදුලිය වැඩපලක් පවත්වාගෙන යාම.

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

ස්වර්ණාභරණ නිපදවීමේ වැඩපොළක් පවත්වාගෙන යාම.

යකඩ වැඩපලක් පවත්වාගෙන යාම.

ලුණු දැමූ මාළු ගබඩා කිරීම.

කරවල ගබඩා කිරීම.

මස් හෝ මාළු සකස් කිරීම හෝ වේලීම.

යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු කිරීම.

බුරුසු සෑදීම.

රබර් වියලා සකස් කිරීම.

අඟුරු සඳහා දර හෝ පොල්කටු පිළිස්සීම.

දහ දෙනෙකුට වැඩිවූ එළු පට්ටියක් පවත්වාගෙන යාම.

දැව හෝ පොල්ලෙලි පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.

සබන් ගබඩා කිරීම.

කුරුඳු, කර්දමුංගු හෝ කෙඳි ආදිය ගෙන් දගම් දුම් ගැස්වීම.

රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

පශු වෛද්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම.

බීඩි නිපදවීම.

සුරුට්ටු නිපදවීම.

සිගරැට් නිපදවීම.

සුන්බුන් ලෝහ ද්‍රව්‍ය ගබඩා කිරීම.

අඟුරු ගබඩා කිරීම.

ගිනියම්කර පැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

පැපොල් කිරි ගබඩා කිරීම.

වයර් හා පියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

ක්‍රේප් රබර් නිපදවීම.

වී කොටන මෝලක් පවත්වාගෙන යාම.

මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම.

දර ගබඩා කිරීම.

දැව ගබඩා කිරීම.

ඇසිටික් ඇසිඩ් ගබඩා කිරීම.

ගල්, උළු, ගඩොල් හෝ කබුක් ගබඩා කිරීම.

තලාතු මිරන් වියලීම.

බෝර ගසා ගල් කැඩීම.

ඉලෙක්ට්‍රෝප්ලේට් කිරීමේ වැඩපලක් පවත්වාගෙනයාම.

බෝට්ටු සාදන ස්ථානයක් පවත්වාගෙනයාම.

එළවළු විකුණන කඩයක් පවත්වාගෙන යාම.

කෘත්‍රිම පොහොර වර්ග ගබඩා කිරීම.

කෘත්‍රිම පොහොර වර්ග නිපදවීම.

හම් පදම්කරන ස්ථානයක් පවත්වාගෙනයාම.

පුවක් වියලීම.

සත්ව ලේ හෝ අකුණුබහන් උණු කිරීම.

සබන් නිපදවීම.

කෙඳි වර්ග නිපදවීම.

කෙඳි වර්ග ගබඩා කිරීම.

කෙඳි වර්ග සායම් කිරීම.

උම්බලකඩ හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.

හුණු, හම් හෝ ඇටකටු හෝ කෘත්‍රිම පොහොර සෑදීම පිණිස පාවිච්චි කරනු ලබන ද්‍රව්‍ය ගෝනි එකකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.

කොප්පරා වේලීම.

පොල්තෙල් නිපදවීම.

කපාපු පොල් නිපදවීම.

උළු හෝ ගඩොල් නිපදවීම.

හුණු පෝරණුවක් පවත්වාගෙන යාම.

ලී ඉරීම.

මිණිරන් ගබඩා කිරීම හෝ සකස් කිරීම.

සිසිල් බීම නිපදවීම.

අයිස් නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

අයිස් හා සිසිල් බීම නිපදවීම.

පැණිරි තෙල් ගබඩා කිරීම.

පුළුන් හෝ පිදුරු ගබඩා කිරීම.

9–220—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වන සහ 156 වන වගන්ති යටතේ පැල්මඩුල්ල සුළු නගර සභාව විසින් සම්පාදිත ව, ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 14 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1964 නොවැම්බර් 20 වන දින අංක 14,230 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) 1 වන අතුරු ව්‍යවස්ථාවෙහි (1) වන ඡේදයට 1 වන අතුරු ව්‍යවස්ථාව වශයෙන් නැවත අංක යෙදීමෙන්;

(2) නැවත අංක යොදනු ලැබූ 1 වන අතුරු ව්‍යවස්ථාවෙහි අවසාන කරුණට ඉක්බිති ව ම පහත සඳහන් අළුත් කරුණු ඇතුළත් කිරීමෙන් :—

"පොල්තෙල් ගැලුම් 50 කට වැඩියෙන් ගබඩා කිරීම.
පපඩම් සෑදීම."

(3) 2 වන අතුරු ව්‍යවස්ථාවෙහි (2) හා (3) වන ඡේදවලට පිළිවෙළින් 2 වන අතුරු ව්‍යවස්ථාව හා 3 වන අතුරු ව්‍යවස්ථාව වශයෙන් නැවත අංක යෙදීමෙන්; හා

(4) නැවත අංක යොදනු ලැබූ 2 වන අතුරු ව්‍යවස්ථාවෙහි අවසාන කරුණට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් කරුණු ඇතුළත් කිරීමෙන් :—

"ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම,

ගෑස් ලාම්පු කුළියට දීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම,

ඉලෙක්ට්‍රොප්ලේටිං වැඩ පළක් පවත්වාගෙන යාම."

9-222—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

ඇල්. ඩී.—බී. 7/65.

## ගම්සභා ආඥාපනත

### මාගුල් බටහිර ගම්සභාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටහිර ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

#### ගොඩනැගිලි, මායිම් තාප්ප සහ දොරටු මාර්ග සෑදීම

1. කිසිම තැනැත්තකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) යම් ගම්බද පාරක මැද සිට අඩි පහලොවක දුරප්‍රමාණයක් ඇතුලත; හෝ

(ආ) යථා කාලයේදී ගම්බද පාරක් බවට පරිවර්තනය කරනු ලැබේ යයි සභාව විසින් නිවේදනය කොට ඇති යම් ගම්බද මාවතක මැද සිට අඩි 10ක දුරප්‍රමාණයක් ඇතුලත; හෝ

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් මාවතක් හැර වෙනයම් මාවතක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුලත කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් නොසෑදිය යුතුය.

2. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය අනුව සභාපතිගෙන් ලබාගත හැකි ඔහුගේ පූර්ව අනුමැතිය නොමැතිව කිසිම තැනැත්තකු විසින් ගම් ප්‍රදේශය තුල ගොඩනැගිල්ලක් සෑදීමට බලාපොරොත්තු ඉඩමේ මායිමේ සිට අඩි අටක් දුර ඇතුලත ඒ ගොඩනැගිල්ල නොසෑදිය යුතුය.

3. යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් සෑදීම ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනයට යටත් පිරිසෙයින් දින තිහකට කලින් ඒ අදහස පිළිබඳව ලිඛිත දැන්වීමක් සභාපති වෙත ඉදිරිපත් කොට ඒ සඳහා අවසර පත්‍රයක් ඔහුගෙන් ලබානොගතහොත් මිස, 1 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ගම්බද මාවතක් හෝ පාරක් අයිනේ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් සෑදීම හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදහස් කර තිබෙන ඉඩමේ මායිමේ සිට අඩි අටක දුර ප්‍රමාණයක් ඇතුළත ඒ ගොඩනැගිල්ල ඉදි කිරීම කිසිම තැනැත්තකු විසින් ආරම්භ නොකළ යුතුය.

4. 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටු මාර්ගයක් ඉදිකිරීම ආරම්භ කර තිබෙන විට ලියවිල්ලකින් වූ දැන්වීමක් ඔහුට භාරදෙනු ලැබීමෙන් පසු ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටු මාර්ගය කඩා දමනලෙස සභාපති විසින් ඔහුට නියම කළ හැකිය.

5. 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකු විසින්ම, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුලත ඒ දැන්වීමෙහි සඳහන් ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටු මාර්ගය කඩා දැමීම හෝ කඩා දමනු ලැබීමට සැලැස්වීම කළ යුතුය.

#### සංචාරක වෙළෙන්දෝ

6. සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් සංචාරක වෙළෙන්දකු වශයෙන් එළවළු, පලතුරු, මාළු හෝ මස් වෙළඳාම පවත්වාගෙන නොයා යුතුය.

7. 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මස 31 වෙනි දින අවසන් විය යුතුය.

#### දඩාවතේ යන ගවයන්

8. ගවයන්, එළුවන්, ඌරන් හෝ බැටළුවන් අයිති සෑම තැනැත්තකු විසින් හෝ භාරව සිටින සෑම තැනැත්තකු විසින් ස්වකීය ගවයින්, එළුවන්, ඌරන් හෝ බැටළුවන් රාත්‍රි කාලයෙහි බැඳ හෝ දිගේලි කොට හා දවල් කාලයෙහි තමාගේ ගවයන්, එළුවන්, ඌරන් හෝ බැටළුවන් බැඳ හෝ දිගේලි කොට හෝ රැක බලාගත යුතුය. නොහික්මුණු සතුන් සම්බන්ධයෙන් උන්ගේ බෙල්ලේ කර පොල්ලක් බැඳ තැබීම හෝ උන් දෙදෙනා බැගින් එකට ඇඳා තැබීම කළ යුතුය.

#### වගාකළ ඉඩම්

9. සභාවේ පාලන සීමා ඇතුලත පිහිටි වගා කරනලද සෑම ඉඩමකම අයිතිකරු විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් දඩාවතේ යන ගවයන් හෝ වෙනත් සතුන් ඒ ඉඩමට ඇතුළුවීම වැලැක්වීම සඳහා ඒ අයිතිකරුගේ හෝ භාරකරුගේ අවශ්‍යතාවන්ට යටත්ව වසා තැබියයුතු ගේට්ටුවක්ද සහිතව ඒ ඉඩම වටේ කටු කම්බි වැටක් හෝ ස්ථිර වැටක් සාදා තිබිය යුතුය.

#### ආයුර්වේද ඖෂධ ශාලා

10. (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 36(ඇ) වැනි වගන්තිය යටතේ සභාව විසින් පිහිටුවන ලද ආයුර්වේද ඖෂධශාලා, සභාව විසින් නඩත්තු කළ යුතු අතර එය 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි කරනලද වෛද්‍යවරයකු භාරයේ තිබිය යුතුය.

11. 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වෛද්‍යවරයා විසින් හෝ සභාව විසින් ඒ සඳහා බලය දෙනලද අන් කිසි නිලධාරියකු විසින් ආයුර්වේද ඖෂධශාලා සම්බන්ධයෙන් සභාව විසින් නියම කළහැකි අන්දමේ ගිණුම් පොත් හා වෙනත් ලේඛන ද සභාව විසින් අනුමත කළහැකි ආකෘතිය අනුව හා එබඳු පිළිවෙලට තැබිය යුතුය.

12. සභාව විසින් ආයුර්වේද ඖෂධශාලා නඩත්තුව සඳහා අවශ්‍ය මුදල් ගම්සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා වෙන්කළ හැකි අතර, එසේ පරිහරනය කිරීම සඳහා සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හෝ විටින් විට සභාව විසින් සම්මත කරනු ලබන පරිපූරක ඇස්තමේන්තු වලින් මුදල් වෙන් කළ යුතුය.

13. 14 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් විධි විධානවලට යටත්ව ආයුර්වේද ඖෂධශාලාවල ප්‍රතිකාර මාගුල් බටහිර ගම්ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමාවිය යුතුය.

14. ආයුර්වේද ඖෂධශාලා වලට සපයනලද බෙහෙත් සහ ඖෂධවල වටිනාකමින් කොටසක් පියවා ගැනීම සඳහා යම් ආයුර්වේද ඖෂධ ශාලාවක ප්‍රතිකාර ලබන එක් එක් රෝගියාගෙන් ශත පණහ නොඉක්මවූ ගාස්තුවක් සභාව විසින් අයකළ හැකිය. සභාපති විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියකු විසින් හෝ රෝගියකුගෙන් අයකරනු ලබන ඒ සෑම ගාස්තුවක්ම සම්බන්ධයෙන් සභාව විසින් අනුමත කරනලද ආකෘතියක් අනුව කුවිතාන්සියක් වහාම නිකුත් කළ යුතුය. ඒ සෑම කුවිතාන්සියක්ම සාබන අනුපිටපතකින් යුක්තවිය යුතු අතර එවා පිළිවෙලින් අංක යොදා තිබිය යුතුය.

15. සභාපති විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 14 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ගාස්තුව ගෙවීමෙන් යම් රෝගියෙකු නිදහස් කළ හැකිය.

16. ආයුර්වේද ඖෂධශාලාවේ නඩත්තුව සඳහා සුභ පතන්නන් ගෙන් ලැබෙන සියලු පරිත්‍යාගයන් තැන්පත් කළ යුතු "ආයුර්වේද අරමුදල" යනුවෙන් හැඳින්වෙන වෙනම අරමුදලක් සභාපති විසින් ආරම්භ කළ හැකිය. ඒ අරමුදලේ මුදල් ආයුර්වේද ඖෂධශාලාවල වියදම් පියවීම සඳහා කලින් කළ යෙදවිය යුතුය.

17. දෙසැම්බර් මාසයේ 31 වෙනි දින අවසන් වන එක් එක් අවුරුද්ද අවසානයේදී, ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද ඖෂධශාලාවල නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියදම්වන මුදල්ද දක්වෙන ප්‍රකාශයක් සභාපති විසින් සම්පාදනය කරවිය යුතුය.

18. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද ඖෂධශාලා" යන්නෙන් සභාව මගින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ඖෂධශාලා අදහස් කරනු ලැබේ.

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් කරනු ලැබේ.

"සභාව" යනුවෙන් මාගුල් බටහිර ගම්ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ.

"ආඥාපනත" යනුවෙන් (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනත අදහස් කරනු ලැබේ.

"ගම්ප්‍රදේශය" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටහිර ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

9-227/1—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

ඇල්.ජී.—බී. 7/65.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටහිර ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඒ. ටී. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථා

### නිලධරයන් හා සේවකයන්

1. සභාවට ලැබියයුතු සියළුම අයබදු හෝ ගාස්තු එකතු කොට සභාවේ මුද්‍රාව හා සභාපතිගේ අත්සනේ සමාන රූපය ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස සභාපති විසින් යම් නිලධරයකුට හෝ වෙන තැනැත්තකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

2. කිසිවකු විසින්—

(අ) ගම්සභා ආඥාපනතේ හෝ එය යටතේ සම්පාදිත යම් අතුරු ව්‍යවස්ථාවක යම් විධිවිධානවලින් හෝ යම් විධිවිධාන යටතේ සභාපති වෙත හෝ සභාවේ වෙනයම් නිලධරයකු වෙත පැවරී ඇති යම් බලතල පැවිච්චි කිරීමේදී හෝ පවරනු ලැබ ඇති යම් යුතුකමක් ඉටු කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේදී ඒ සභාපතිට හෝ නිලධරයාට ; හෝ

(ආ) සභාව විසින් හෝ සභාව වෙනුවෙන් සේවයෙහි යොදාගන්නා ලද යම් සේවකයකුට හෝ කම්කරුවකුට සභාපති විසින් හෝ සභාවේ වෙන යම් නිලධරයකු විසින් නීත්‍යානුකූලව පවරා තිබෙන යම් යුතුකමක් ඉටුකිරීමේදී ඒ සේවකයාට හෝ කම්කරුවාට

ඕනෑකමින් බාධා නොකළ යුතුය.

### ප්‍රසිද්ධ දැන්වීම්

3. කිසිවකු විසින් සභාවේ අණපිට ප්‍රදර්ශනය කර තිබෙන යම් දැන්වීමක් විරූප කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතුය.

4. ආඥාපනතේ හෝ එය යටතේ සම්පාදිත යම් අතුරු ව්‍යවස්ථාවක යම් විධිවිධාන යටතේ සභාව විසින් කරගෙන යනු ලබන වැඩක් සම්බන්ධයෙන් සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ සවිකරන ලද යම්කිසි දැන්වීම් පුවරුවක්, වැටක්, කණුවක් හෝ බාධකයක් නැතහොත් වෙනයම් දෙයක් ඉවත් කිරීම හෝ යම් දැන්වීමක සඳහන් නියමයන් ඕනෑකමින් කඩ කිරීම කිසිවකු විසින් නොකළ යුතුය.

5. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් කරනු ලැබේ.

"සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල් බටහිර ගම්ප්‍රදේශයේ ගම්සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් 1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනත අදහස් කරනු ලැබේ.

9-227/2—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

ඇල්. ජී.—බී. 14/64.

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) සහ 152 වැනි වගන්ති යටතේ පැල්මඩුල්ල සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඒ. ටී. ගොගර්ලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ජූනි මස 28 වැනි දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ අය කරනු ලබන 1965 වැනි වර්ෂය සඳහා වූ කසළ ශෝධනය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මීට යාකොට ඇති උප ලේඛනයේ විස්තර කැරෙන ස්ථානයන් නිදහස් කළ යුතුය.

### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරන ස්ථානයන් :—

### අංක 1 දරන ඡන්ද කොට්ඨාශය

රත්නපුර පාර :—1, 3, 5, 5/ඒ, 7, 9, 11, 13, 13/ඒ, 15, 15/ඒ, 17, 17/ඒ, 19, 19/ඒ, 19/බී, 21, 23, 23/ඒ, 25, 25/ඒ, 25/බී, 27, 29, 31, 31/ඒ, 33, 35, 37, 39, 41, 43, 45, 45/ඒ, 47, 47/ඒ, 47/බී, 47/සී, 49, 51, 53, 55, 57, 59, 61, 63, 63/ඒ, 65, 67, 69, 71, 71/ඒ, 71/බී, 73, 75, 77, 79, 81, 83, 85, 87,

(අ) එකී ඉල්ලුම් පත්‍රය, අළුත් බලපත්‍රයක් සම්බන්ධයෙන් නම් එකී අවසර පත්‍රය අවශ්‍ය රෙදි අළුල් ලන ස්ථානයක් තබා ගැනීමේ ව්‍යාපාරය ආරම්භ කිරීමේ යෝජිත දිනයට තිස් දිනකට කලින් ; හා

(ආ) එකී ඉල්ලුම් පත්‍රය දැනට තිබෙන අවසර පත්‍රයක් අළුත් කිරීම සම්බන්ධයෙන් නම්, ඒ අවසර පත්‍රය අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මස පළමු වැනි දින හෝ ඊට මත්තෙන් ද එකී ඉල්ලුම් පත්‍රය

සභාපති වෙත ලැබෙන පරිදි යැවිය යුතුය."

70. මෙම අතුරු ව්‍යවස්ථාවලින් යමක් හෝ මෙහි දැක්වෙන 46 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක නිශ්චිත ව සඳහන් කොන්දේසිවලින් යමක් හෝ උල්ලංඝනය කරන සෑම අවස්ථාවක දී ම, රුපියල් දහයකට වැඩි නො වූ දඩයක් නියම කරනු ලැබීමෙන් ද, නියමිත අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් පසු ව ද තවදුරටත් එ සේ උල්ලංඝනය කර ගෙන යනු ලැබේ නම්, එසේ කරගෙන යනු ලබන එක් එක් දවස වෙනුවෙන් රුපියල් දහයකට වැඩි නො වන අතිරේක දඩයක් නියම කරනු ලැබීමෙන් ද දඬුවම් පැමිණ විය යුතුය.

71. මේ අතුරු ව්‍යවස්ථාවල—

"තාවකාලික නිර්මාණය" යන්නට එහා මෙහා ගෙන යා හැකි වේදිකාවක්, ඉවත් කර ගත හැකි රාක්කයක්, තාන්දයක් සවි කර තිබෙන වේදිකාවක්, ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ වුව ද බිමට සවිකර තිබෙන ආධාරකයන් උඩ නගන ලද තාන්දයක් හෝ රෝද පිට සවි කොට නතර කර තිබෙන යම් නිර්මාණයක් ඇතුළත් වේ ;

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ;

"සභාව" යන්නෙන් කඩවත් සතර ගම් ප්‍රදේශයේ ගම් සභාව අදහස් වේ; තවද

"ගම් ප්‍රදේශය" යන්නෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම් ප්‍රදේශය අදහස් වේ.

## උපලේඛනය

### 2 වැනි අතුරු ව්‍යවස්ථාව

"ඒ" අක්ෂරය දරන ආකෘතිපත්‍රය

**මසුරු හා කුණු රොඩු එකතු කිරීම පිණිස වූ බලපත්‍රයයි**

............................................................ පදිංචි .................. නැමැති අයට 19.........................මස......... වැනි දින සිට 19... ...................... මස ......... වැනි දින දක්වා වූ කාල සීමාව තුළ පහත සඳහන් ඉඩම් වලින් මසුරු හා කුණු රොඩු එකතු කිරීමට මෙයින් බලය දෙනු ලැබේ.

..........................................,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ
කඩවත් සතර ගම් සභාපති.

කඩවත් සතර ගම් සභා කාර්යාලය,
නානුඔය,
දිනය :............

"බී" අක්ෂරය දරන ආකෘති පත්‍රය

(6)(1) වැනි අතුරු ව්‍යවස්ථාව

**මසුරු හා කුණු රොඩු ඉවත් කිරීම පිණිස වූ බලපත්‍රයයි**

................................................ පදිංචි ........................... නමැති අයට.........................................න් මසුරු හා කුණු රොඩු ..................ක් ඉවතට ගෙන යැමට මෙයින් බලය දෙනු ලැබේ.

ගම් ප්‍රදේශයෙන් මසුරු හා කුණු රොඩු ඉවත් කිරීමට මත්තෙන් මෙම බලපත්‍රය සභාපතිට බාර දිය යුතුයි.

..........................................,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ
කඩවත් සතර ගම් සභාපති.

කඩවත් සතර ගම් සභා කාර්යාලය,
නානුඔය,
දිනය :..............

9-211/1—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

# පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශිය බලමණ්ඩල ඡන්ද විමසීම ආඥාපනත

(262 වැනි අධිකාරය)

ප්‍රාදේශිය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66(2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ආර්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශිය බලමණ්ඩල).

1965 අගෝස්තු 24 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **කොළඹ දිස්ත්‍රික්කය** |
| | | **කඳාන සුළු නගර සභාව** |
| 1 | ... | කනුගලවත්තගේ ජෝශප් පෙරේරා |
| | | **නුවරඑළිය දිස්ත්‍රික්කය** |
| | | **නුවරඑළිය මහා නගර සභාව** |
| 10 | ... | ඩී. පී. ආර්. වීරසිංහ |
| | | **යාපනය දිස්ත්‍රික්කය** |
| | | **කරවෙටි ගම් සභාව** |
| 7 | ... | ආර්. සභාසිවම් |
| | | **කුරුණෑගල දිස්ත්‍රික්කය** |
| | | **මහව ගම් සභාව** |
| 2 | ... | මුතිවීර තන්ත්‍රිගේ සෑම් සිල්වා |
| | | **අම්පාර දිස්ත්‍රික්කය** |
| | | **අක්කරපත්තු උතුර ගම් සභාව** |
| 3 | ... | ඉස්මායිල් මිස්කින්බාවා මරෛකාර් |

9-214—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## කඳාන සුළු නගර සභාව

1962 පෙබරවාරි 1 වැනි දින සිට 1962 දෙසැම්බර් 31 වැනි දින දක්වා
ආදායම් හා වියදම් පිළිබඳ ලේඛනය

| ආදායම් | රු. ශ. | රු. ශ. | වියදම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| (ඒ) සාමාන්‍ය ... ... | 60,308 90 | | (ඒ) සාමාන්‍ය ... ... | 27,307 28 | |
| (බී) මහාමාර්ග ... ... | 3,264 53 | | (බී) මහාමාර්ග ... ... | 12,101 68 | |
| (සී) නගර සහා ඉඩම් හා ගොඩනැගිලි ... | 78 0 | | (සී) නගර සහා ඉඩම් හා ගොඩනැගිලි ... | 1,295 14 | |
| (ඩී) මහජන සෞඛ්‍ය ... ... | 29,237 41 | | (ඩී) මහජන සෞඛ්‍ය ... ... | 34,967 84 | |
| (ඊ) මහජන විනෝදය ... ... | 1,849 50 | | (ඊ) මහජන විනෝදය ... ... | — | |
| (ඈෆ්) සොහොන් බිම ... ... | 50 0 | | (ඈෆ්) සොහොන් බිම ... ... | — | |
| | | 94,788 34 | | | 75,671 94 |

**වෙනත් ආදායම්—**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| (1) තැන්පත් ... ... | 77,666 39 | |
| (2) අත්තිකාරම් ... | 1,855 6 | |
| (3) විවිධ ණය හිමියෝ ... ... | 79,273 46 | |
| (4) විදුලි ගිණුම ... ... | 1,77,013 56 | |
| (5) විවිධ ණය කරුවෝ ... ... | 98,861 63 | |
| (6) රජයේ ආධාර ... ... | 39,130 27 | |
| (7) අධිකය ... ... | 42,611 90 | |
| | | 5,16,412,27 |
| (8) ආදායම් එකතුවේ ගනුදෙනු:— | | |
| (ඒ) දේපළ බද්ද ... ... | 12,395 59 | |
| (බී) වසුරු ගාස්තු ... ... | 3,970 0 | |
| (සී) විදුලි ගාස්තු ... ... | 1,25,115 37 | |
| (ඩී) කුලී ... ... | 24,084 91 | |
| | | 1,65,565 87 |
| | | 7,76,766 48 |

**වෙනත් වියදම්—**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| (1) තැන්පත් ... ... | 20,340 69 | |
| (2) අත්තිකාරම් ... ... | 3,000 0 | |
| (3) විවිධ ණය හිමියෝ ... | 35,117 65 | |
| (4) විදුලි ගිණුම ... ... | 1,53,212 77 | |
| (5) විවිධ ණය කරුවෝ ... | 1,16,792 99 | |
| (6) රජයේ ආධාර ... ... | 2,035 0 | |
| | | 3,30,499 10 |
| (7) ආදායම් එකතුවේ ගණුදෙනු :— | | |
| (ඒ) දේපළ බද්ද ... ... | 49,419 57 | |
| (බී) වසුරු ගාස්තු ... ... | 5.040 0 | |
| (සී) විදුලි ගාස්තු ... ... | 1,85,014 86 | |
| (ඩී) කුලී ... ... | 25,610 16 | |
| | | 2,65,084 59 |
| 1962 දෙසැම්බර් 31 වැනි දිනට ඉතිරි ... | | 1,05,510 85 |
| | | 7,76,766 48 |

කදාන සුළු නගර සභාවේ 1962 පෙබරවාරි 1 වැනි දින සිට 1962 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන පූර්වෝක්ත ආදායම් හා වියදම් ප්‍රකාශය, කදාන සුළු නගර සභාපති වන ජෙරාඩ් බෙනඩික් හල්පෙ වන මම මගේ දැනීමේ හා විශ්වාසයේ අන්දමට සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති,
කදාන සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

ඇම්. ඩී. අල්බානු අප්පුහාමි,
සාමාජික,
කදාන සුළු නගර සභාව.

1964 නොවැම්බර් මස 16 වැනි දින මා ඉදිරිපිට කදාණේදී සහතික කරන ලදී.

ඩී. ඔලිවර් ජයසූරිය,
සමාදාන විනිශ්චයකාර තුමා.

## 1962 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් ... ... ... | | | 57,325 70 |
| රජයේ ආධාර:— | | | |
| (අ) මුදුක්කු සංහාරයට ... ... | | 20,000 0 | |
| (ආ) ක්‍රීඩා භූමි ... ... | | 15,000 0 | |
| (ඇ) ප්‍රජා මණ්ඩල ... ... | | 557 0 | |
| (ඈ) කාර්යාල උපකරණ ... | | 1,538 27 | |
| | | | 37,095 27 |
| විවිධ ණය හිමියෝ ... ... | | | 44,155 81 |
| අධිකය හා ඌනතාව (සාමාන්‍ය) :— | | | |
| 1962.2.1 දිනට අධිකය ... ... | | 42,611 90 | |
| 1962 අය ... | 94,788 34 | | |
| 1962 වැය ... | 75,671 94 | | |
| | | 19,116 40 | |
| | | | 61,728 30 |
| අධිකය හා ඌනතාව (විදුලි) :— | | | |
| 1962 අය ... | 1,77,013 56 | | |
| 1962 වැය ... | 1,53,212 77 | | |
| | | | 23,800 79 |
| | | | 2,24,105 87 |

**වත්කම්**

| | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... ... | 1,144 94 |
| විවිධ ණය කරුවෝ ... ... ... | 17,931 36 |
| දේපල බද්ද ... ... ... | 37,023 93 |
| වසුරු ගාස්තු ... ... ... | 1,070 0 |
| කුලී ... ... ... | 1,525 25 |
| විදුලි ගාස්තු ... ... ... | 59,899 49 |
| මුදල් ... ... ... | 1,05,510 85 |
| | 2,24,105 87 |

කදාන සුළු නගර සභාවේ සභාපති, ජෙරාඩ් බෙනඩික් හල්පෙ වන මම, ඉහත සඳහන් 1962 දෙසැම්බර් මස 31 වැනි දිනට දක්වෙන කදාන සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශය මගේ දැනීමේ හා විශ්වාසයේ අන්දමට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති,
කදාන සුළු නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

ඇම්. ඩී. අල්බානු අප්පුහාමි,
සාමාජික,
කදාන සුළු නගර සභාව.

1964 නොවැම්බර් මස 16 වැනි දින මා ඉදිරිපිට කදාණේදී සහතික කරන ලදී.

ඩී. ඔලිවර් ජයසූරිය,
සමාදාන විනිශ්චයකාර තුමා.

9-231—65.9.3 දින අංක 14,495 දරන ගැසට් පත්‍රය

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1964 වර්ෂයේ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය

| ආදායම් | ගණන රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| (ඒ) සාමාන්‍ය ආදායම් ... | ... 2,90,510 16 | |
| (බී) පොදු මංමාවත් ... | ... 3,279 60 | |
| (සී) කානායම් සහ අම්බලම් | ... 10,342 96 | |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | ... 8,285 45 | |
| (ඊ) ජනජන සෞඛ්‍යය ... | ... 64,121 58 | |
| (ඇෆ්) ජනජන විනෝද කටයුතු | ... 40,007 15 | |
| (ජී) සොහොන් බිම ... | ... 833 0 | |
| (එච්) සුනඛයින් ලියාපදිංචි කිරීම | ... 102 0 | |
| (අයි) තරාදි පඩි සහ සේරු | ... 882 ·65 | |
| (ජේ) විදුලිය දෙපාර්තමේන්තුව | ... 3,08,703 79 | |
| (ඇම්) කියවීම් ශාලා ... | ... 67 0 | 7,27,135 34 |
| තැන්පත් ... | ... 42,095 20 | |
| අත්තිකාරම් ... | ... 22,160 29 | |
| දීමනා (පුස්තකාල) ... | ... 522 95 | |
| විදුලිය යෝජනා ක්‍රමයේ ක්ෂයවීමේ ගිණුම | 5,000 0 | |
| | | 69,778 44 |
| 63.12.31 වැනි දිනට ඉතිරි ... | | ... 97,383 59 |
| | | 8,94,297 37 |

| වියදම් | ගණන රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| (ඒ) සාමාන්‍ය ආදායම් | ... 84,381 67 | |
| (බී) පොදු මංමාවත් ... | ... 80,231 23 | |
| (සී) කානායම් සහ අම්බලම් | ... 9,690 63 | |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 29,973 91 | |
| (ඊ) ජනජන සෞඛ්‍යය | ... 1,59,633 34 | |
| (ඇෆ්) ජනජන විනෝද කටයුතු. | ... 2,094 42 | |
| (ජී) සොහොන් බිම් ... | ... 3,485 17 | |
| (එච්) සුනඛයින් ලියාපදිංචිකිරීම | ... 279 0 | |
| (අයි) තරාදි පඩි සහ සේරු | ... 463 42 | |
| (ජේ) විදුලිය දෙපාර්තමේන්තුව | ... 2,23,937 06 | |
| (ඇම්) කියවීම් ශාලා | ... 6,826 89 | 6,00,996 74 |
| තැන්පත් ... | ... 37,219 58 | |
| අත්තිකාරම් මුදල් ... | ... 23,589 81 | |
| දීමනා (පුස්තකාල) ... | ... 17,471 17 | |
| තීර තැන්පත් ... | ... 3,337 83 | |
| | | 81,618 39 |
| 64.12.31 වැනි දිනට ඉතිරි ... | | ... 2,11,682 24 |
| | | 8,94,297 37 |

ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ 1964 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන පූර්වෝක්ත ආදායම් සහ වියදම් ප්‍රකාශය එම සභාවේ සභාපති වන චාර්ල්ස් රොබර්ට් ඇලෙක්සැන්ඩර් සමරක්කොඩි වන මම මගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ අන්දමට නිවැරදි හා සත්‍ය ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

සී. ආර්. ඒ. සමරක්කොඩි,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

ඩබ්ලිව්. ඇස්. පෙරේරා,
1 වැනි කොට්ඨාශයේ සභික.

1965 මාර්තු මස 15 වැනි දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

ජේ. පී. ජිනදාස,
සමාදාන විනිශ්චයකාර තැන.

1965 මාර්තු 15 වැනි දින,
ගම්පහ නගර සභා කාර්යාලය.

### 1964 දෙසැම්බර් 31 වැනි දිනට දක්වෙන වත්කම් හා බැරකම් ප්‍රකාශය

| බැරකම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| තැන්පත් කරුවන්ට ගෙවිය යුතු මුදල් ... | | ... 64,707 61 |
| මුද්දක්කු සංහාර ණය ගිණුම ... | | ... 6,495 25 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ ක්ෂයවීමේ ගිණුම | | ... 60,000 00 |
| නිවාස යෝජනා ක්‍රමය සඳහා රජයේ ආධාර | | ... 38,960 11 |
| පුස්තකාලය සඳහා දීමනා ගිණුම ... | | ... 4 24 |
| 1963.12.31 දිනට අධිකය | ... 40,536 15 | |
| 1964 වර්ෂයේ ආදායම් ... | ... 7,27,135 34 | |
| | 7,67,671 49 | |
| 1964 වර්ෂයේ වියදම් ... | ... 6,00,996 74 | |
| 1964.12.31 දිනට අධිකය ... | | ... 1,66,674 75 |
| | | 3,36,841 96 |

| වත්කම් | රු. ශ. |
|---|---|
| අත්තිකාරම් ... ... | ... 10,460 65 |
| ලංකා බැංකුවේ ස්ථිර තැන්පත් ... | ... 1,14,599 07 |
| ලංකා සේවිංස් බැංකුවේ තැන්පත් ... | ... 100 00 |
| 1964.12.31 දිනට මුදල් පොතේ ඉතිරි ... | ... 2,11,682 24 |
| | 3,36,841 96 |

ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ 1964 දෙසැම්බර් මස 31 වැනි දිනට දක්වෙන පූර්වෝක්ත වත්කම් හා බැරකම් ප්‍රකාශය එම සභාවේ සභාපති වන චාර්ල්ස් රොබර්ට් ඇලෙක්සැන්ඩර් සමරක්කොඩි වන මම මගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

සී. ආර්. ඒ. සමරක්කොඩි,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නිවැරදි බවම සහතික කරමි.

ඩබ්ලිව්. ඇස්. පෙරේරා,
1 වැනි කොට්ඨාශයේ සභික.

1965 මාර්තු මස 15 වැනි දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

ජේ. පී. ජිනදාස,
සමාදාන විනිශ්චයකාර තැන.

1965 මාර්තු 15 වැනි දින,
ගම්පහ නගර සභා කාර්යාලයේ දී ය.

## දෙවිනුවර සුළු නගරසභාව

### 1963 දෙසැම්බර් මස 31 වැනි දිනට දෙවිනුවර සුළු නගරසභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ ශේෂපත්‍රය

| වත්කම් | | රු. ශ. | රු. ශ. | බැරකම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|---|
| තැන්පත් (සාමාන්‍ය) ... ... | | | 47,493 19 | | | |
| ආණ්ඩුවේ ආධාර (වියදම් නොවූ) | | | | අන්තිකාරම් (සාමාන්‍ය) ... ... | 2,949 10 | |
| පුරාණවැල්ල පාර ... | | 5,265 80 | | (සිල්ලර බඩු ගබඩාව) ... | 8,980 04 | |
| කිරලවැල්ල පාර ... | | 69 74 | | | | 11,929 14 |
| නිවාස යෝජනා ක්‍රමය ... | | 65,985 04 | | ලැබිය යුතු :— | | |
| ක්‍රීඩා පිටිය ... ... | | 3,000 00 | | වරිපනම් බදු ... | 7,043 31 | |
| පුස්තකාලය ... ... | | 2,470 69 | | වැසිකිළි බදු ... | 5,418 05 | |
| වාරවුම් පාර ... ... | | 941 44 | | වැසිකිළි ගාස්තු ... | 144 0 | |
| වාඩියා පාර ... ... | | 93 63 | | ආදර්ශ නිවාස ... | 289 0 | |
| කැරකොප්පුව පාර ... | | 327 50 | | විදුලි බල ගාස්තු ... | 8,405 49 | |
| | | | 78,153 19 | වෙළඳපොල බදු ... | 464 02 | |
| ආණ්ඩුවේ ණය (ප්‍රසිද්ධ වෙළඳාම් පොල) ... | | | 4,814 10 | | | 22,363 87 |
| අගය අඩුවීමේ ගිණුම (විදුලිය) ... | | | 4,000 0 | ඉතිරිකිරීමේ ගිණුම (ලංකා බැංකුව, මාතර) | | 41,907 56 |
| ණය ගැතියෝ ... ... | | | 16,081 58 | ණය හිමියෝ ... ... | | 39,318 75 |
| අධිකය ගිණුම (සාමාන්‍ය) | | | | | | |
| අධිකය 63.1.1 දිනට ... | | 11,176 93 | | මුදල් : බැංකුවේ ... ... | 42,385 25 | |
| 63.1.1 දිනට සිට 63.12.31 | | | | දිසාපති කාර්යාලයේ ... | 6,648 58 | |
| දින වැය ... | 77,264 54 | | | | | 49,033 83 |
| 63.1.1 දින සිට 63.12.31 දිනට | | | | | | |
| අය ... | 68,964 42 | 8,300 12 | | | | |
| 63.12.31 දිනට අධිකය ... ... | | | 2,876 81 | | | |
| අධිකය ගිණුම : (විදුලිය) | | | | | | |
| අධිකය 63.1.1 දිනට ... | | 13,183 98 | | | | |
| වැය 63.1.1 දින සිට 63.12.31 | | | | | | |
| දිනට ... | 56,355 71 | | | | | |
| අය 63.1.1 දින සිට 63.12.31 | | | | | | |
| දිනට ... | 54,305 31 | | | | | |
| | | 2,050 40 | | | | |
| 63.12.31 දිනට අධිකය ... ... | | | 11,133 58 | | | |
| | | | 1,64,553 15 | | | 1,64,553 15 |

දෙවිනුවර සුළු නගරසභාවේ සභාපති වන, හෙ.වි. ඩික්සන් සිල්වා වන මම, මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට දෙවිනුවර සුළු නගරසභාව වෙනුවෙන් 1963, වර්ෂය තුළ ලබන ලද හා ගෙවන ලද සියළුම මුදල් පිළිබඳ සැබෑ නිවරද වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

හෙ. වි. ඩික්සන් සිල්වා
සභාපති,
දෙවිනුවර සුළු නගරසභාව

නිවැරදි බවට සහතික කරමි.

ඇස්. ධර්මදස,
අංක 6 දරණ කොට්ඨාශයේ නියෝජිත.

1964 ජූලි මස          දින මාතරදී මා ඉදිරිපිට සහතික කරන ලදි.

කි. පු. සමරවික්‍රම,
සමාදාන විනිශ්චයකාර.

සුළු නගරසභා කාර්යාලය,
දෙවිනුවර. 1964.7.7.

### 1963 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් වාර්තාව

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| (ඒ) පොදු අය ... ... ... | 51,781 80 | (ඒ) පොදු වැය ... ... ... | 21,270 97 |
| (බී) මාර්ග/පාරවල් ... ... ... | 1,756 80 | (බී) මාර්ග/පාරවල් ... ... | 5,839 15 |
| (සී) සභාවට අයත් ගොඩනැගිලි හා ඉඩම් ... | 601 80 | (සී) සභාවට අයත් ගොඩනැගිලි ... ... | 11,065 93 |
| (ඩී) මහජන සෞඛ්‍ය ... ... ... | 13,117 89 | (ඩී) මහජන සෞඛ්‍ය ... ... | 37,192 54 |
| (ඊ) මහජන විනෝදය ... ... ... | 166 0 | (ඊ) මහජන විනෝදය ... ... | — |
| (එෆ්) සුසාන භූමි ... ... ... | 564 50 | (එෆ්) සුසාන භූමි ... ... ... | — |
| (ජී) සුනඛයන් ලියා පදිංචි කිරීම ... ... | 3 0 | (ජී) සුනඛයන් ලියා පදිංචි කිරීම ... ... | — |
| (ජේ) කියවීම්ශාලා හා පොත්ගුල් ... ... | 972 63 | (ජේ) කියවීම්ශාලා හා පොත්ගුල් ... ... | 1,895 90 |
| | 68,964 42 | | 77,264 5 |

| | රු. | ශ. |
|---|---|---|
| **වෙනත් අය.—** | | |
| තැන්පත් | 33,524 | 95 |
| අත්තිකාරම් | 11,619 | 10 |
| විදුලිය ගිණුම | 54,305 | 31 |
| ණය ගැතියෝ ගිණුම | 9,943 | 54 |
| ණය හිමියෝ ගිණුම | 15,516 | 85 |
| ස්ථාවර තැන්පත් මුදල | 1,00,000 | 0 |
| ගෙවියාමේ වට්ටාකම (විදුලිය) | 1,000 | 0 |
| **ආදයම් එකතුකිරීමේ ගිණුම.—** | | |
| වරිපනම් බදු | 8,986 | 73 |
| කසළශෝධක බදු | 6,106 | 34 |
| වැසිකිළි ගාස්තු | 288 | 0 |
| වෙළඳපොල බදු | 432 | 0 |
| ආදර්ශ නිවාස බදු | 194 | 0 |
| විදුලි ගාස්තු | 39,600 | 25 |
| සිල්ලර බඩු ගබඩාව | 31,026 | 55 |
| **ආණ්ඩුවේ ණය.—** | | |
| ප්‍රසිද්ධ වෙළඳාම් පොල | 28,800 | 0 |
| **ආණ්ඩුවේ ආධාර.—** | | |
| වෙලේගොඩ පුරාණවැල්ල පාර | 75 | 0 |
| පුස්තකාලය | 1,076 | 30 |
| ඇසල උත්සව ගිණුම | 937 | 0 |
| කැරකොප්පුව පාර | 2,999 | 0 |
| | 4,15,395 | 34 |
| 63.1.1 දිනට ශේෂය | 7,552 | 53 |
| | 4,22,947 | 87 |

| | රු. | ශ. |
|---|---|---|
| **වෙනත් වැය.—** | | |
| තැන්පත් | 10,704 | 50 |
| අත්තිකාරම් | 11,846 | 10 |
| විදුලිය ගිණුම | 56,355 | 71 |
| ණය ගැතියෝ ගිණුම | 28,827 | 35 |
| ණය හිමියෝ ගිණුම | 4,015 | 45 |
| ස්ථාවර තැන්පත් මුදල | 50,000 | 0 |
| ඉතිරිකිරීමේ ගිණුම (ලංකා බැංකුව, මාතර) | 895 | 79 |
| **ආදයම් එකතුකිරීමේ ගිණුම.—** | | |
| වරිපණම් බදු | 11,049 | 05 |
| කසළශෝධක බදු | 7,544 | 68 |
| වැසිකිළි ගාස්තු | 336 | 0 |
| වෙළඳපොල බදු | 896 | 02 |
| ආදර්ශ නිවාස බදු | 216 | 0 |
| විදුලිය ගාස්තු | 40,744 | 23 |
| සිල්ලර බඩු ගබඩාව | 33,269 | 94 |
| **ආණ්ඩුවේ ණය.—** | | |
| ප්‍රසිද්ධ වෙළඳාම් පොල | 23,985 | 90 |
| **ආණ්ඩුවේ ආධාර.—** | | |
| වෙලේගොඩ පටු මඟ | 33 | 53 |
| පුස්තකාලය | 329 | 53 |
| ඇසළ උත්සව ගිණුම | 937 | 0 |
| කැරකොප්පුව පාර | 2,671 | 50 |
| වටරවුම් පාර | 1,066 | 0 |
| නිවාස යෝජනා ක්‍රමය | 367 | 0 |
| වාඩියා පාර | 10,136 | 12 |
| මාර්කට් පැසේජ් | 76 | 10 |
| ගල්ගනේ පාර | 175 | 0 |
| කිරලවැල්ල පාර | 171 | 0 |
| | 3,73,914 | 04 |
| 63.12.31 දිනට ශේෂය | 49,033 | 33 |
| | 4,22,947 | 87 |

දෙවිනුවර සුළු නගරසභාවේ සභාපති, හෙ.වි ඩික්සන් සිල්වා වන මම, මාගේ උසස්ම දැනුමේ හා විශ්වාසයේ හැටියට දෙවිනුවර සුළු නගරසභාව වෙනුවෙන් 1963 වර්ෂය තුළ ලබන ලද හා ගෙවන ලද සියළුම මුදල් පිළිබඳ සැබෑ නිවරද වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

හෙ. වි. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙවිනුවර සුළු නගරසභාව.

එස්. ධර්මදාස.
අංක 6 දරන කොට්ඨාශයේ නියෝජිත.

නිවැරදි බවට සහතික කරමි.

1964 ජූලි මස  දින මාතර දී මා ඉදිරිපිටදී සහතික කරන ලදි.

කි. සු. සමරවික්‍රම,
සමාදාන විනිශ්චයකාර තැන.

සුළු නගරසභා කාර්යාලය,
දෙවිනුවර, 1964.7.7.
8-209—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## පස්සර සුළු නගරසභාව

### 1965 අය වැය ලේඛණය—1 වන කොටස—සාමාන්‍ය

### සුළු නගරසභා මුදල් නියෝග 40 (ii) යටතේ දයැම් පත්‍රය

ඇතැම් වැය ශීර්ෂයන්ගෙන් ඉතිරිවෙන මුදල් ඊට අනුරූප පහත සඳහන් අතිරික්තයන් පියවා ගැනීම—1965 අගෝස්තු මස 16 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 7 දරණ කාරණය යටතේ සභා සම්මත කර ගන්නා ලදී.

| ශේෂය | රු. | ශ. | අතිරික්තය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම්:— | | | සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම් :— | | |
| 7. අළුත් වැඩ | 250 | 0 | 4. නඩත්තුව | 250 | 0 |

1965.8.21 වෙනි දින,
පස්සර සුළු නගරසභා කාර්යාලයේ දී ය.

ටී. පී. ඇඩම්න්,
සභාපති, සුළු නගරසභාව, පස්සර.

### 1965 දෙවන පරිපූරක වැය ලේඛණය

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | අනුමතිය |
|---|---|---|---|
| ටී.—මහජන විනෝදය :— | | | |
| 4. ආඥපනත යටතේ ඉඩම් ලබා ගැනීම | 1,000 | 0 | 1965.7.29 වැනි දින අංක 1 දරණ යෝජනාව. |
| බී.—අංමාවත් :— | | | |
| 8. දියුණු කිරීම | 650 | 0 | 1965.8.16 වැනි දින අංක 2 (ඇ(ජ) දරණ යෝජනාව. |
| ටී.—ඩී. 3 නිවෙස්වලට විදුලි බලය සැපයීම :— | | | |
| (බී) කම්කරු වැටුප් (තාවකාලික) | 500 | 0 | 1965.8.16 වැනි දින අංක 9 දරණ යෝජනාව. |

මෙම වැය ශීර්ෂයන් ඉහත සඳහන් යෝජනා යටතේ සභා සම්මත වූ බවට සහතික කරමි.

ටී. පී. ඇඩමන්,
සභාපති, සුළු නගරසභාව, පස්සර.

1965.8.21 වෙනි දින,
පස්සර සුළු නගරසභා කාර්යාලයේ දී ය.
9-229—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය**

### 1965 අයවැය ලේඛනය

**1 වෙනි කොටස**

1965 වර්ෂයේ අයවැය ලේඛනයේ මුදල් ඉතුරු වේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා ගිය ශීර්ෂයන්ට මෙහි පහත පෙන්වන පරිදි මුදල් මාරුකිරීමට 1965 ක්වූ ජූනි මස 25 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 4 (i) දරණ සභා තීරණයෙන් සම්මත කරගන්නා ලදී.

**ඉතිරි වේයයි ගණන් බලා ඇති උප ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| බී. 4—විථි ආලෝක කිරීම ... ... ... | 2,000 | 0 |
| ඩී. 1 (එච්)—කානු ඉදිකිරීම ... ... ... | 1,000 | 0 |
| ඩී. 5 (ඊ.)—ජල සම්පාදනය ඉදිකිරීම ... ... | 2,050 | 0 |
| ඩී. 5 (එච්.)—ජල සම්පාදනය ඉදිකිරීම ... ... | 2,500 | 0 |
| එකතුව ... | 7,550 | 0 |

**වැඩිපුර මුදල් අවශ්‍යව ඇති උප ශීර්ෂ**

| | | |
|---|---|---|
| ඒ. 2 (සී)—අයකැමි ගාස්තු ... ... | 1,000 | 0 |
| ඒ. 2 (ඩී)—තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... ... | 750 | 0 |
| ඒ. 2 කේ. කාර්යාල භාණ්ඩ හා උපකරණ ... ... | 3,000 | 0 |
| ඒ. 3.—ආපසු ගෙවීම ... ... ... | 100 | 0 |
| සී. 4.—ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කිරීම ... | 1,000 | 0 |
| ඩී. 2 (සී)—කසල ශෝධනය—උපකරණ ... ... | 750 | 0 |
| ඩී. 3. (සී)—වැසිකිලි ශෝධනය—උපකරණ ... | 750 | 0 |
| ජී. 1—සුනඛ ඝාතනය ... ... ... | 200 | 0 |
| එකතුව ... | 7,550 | 0 |

ඩී. ආර්. අමරරත්න,
සභාපති,
සුළු නගර සභාව, හිඟුරක්ගොඩ.

1965 ජූනි මස 25 වෙනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

සී. ඩබ්ලිව්. ද සිල්වා,
ප. පා. ස. කොමසාරිස්,
උ. මැ. කො.

අනුරාධපුර,
1965 අගෝස්තු 23 වැනි දින දීය.
9-225—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## මතුගම සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් නියෝග අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පතයි**

### අයවැය ලේඛනය—1965

1965 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේ යයි ගණන් බලන ලද මුදල්, අන්‍ය වැය සම්මතයන්ට අනුරූප අතිරේක මුදල් පියවා ගැනීම සඳහා යෙදවීමට, 1965 අගෝස්තු මස 21 වැනි දින පවත්වනු ලැබූ මතුගම සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 3 (7) දරණ යෝජනා ස්ථිරත්වය අනුව පහත සඳහන් අන්දමට සම්මත කර ගන්නා ලදී.

| ඉතිරි මුදල් | රු. | ශ. |
|---|---|---|
| ඒ 2 (ඩී)—තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... | 400 | 0 |
| ඒ 2 (ජී)—කැන්ත හා බෝට්ටු කහවූ මිල ... | 14 | 0 |
| ඒ 2 (එල්)—නිල ඇඳුම් ... ... ... | 342 | 25 |
| ඒ 4—ආධාර හා දීමනා ... ... | 300 | 0 |
| සී 7—අදත් කර්මාන්ත ... ... ... | 1,829 | 75 |
| ඩී 1 (සී)—දීමනා ... ... ... | 40 | 0 |
| ඩී 1 (එෆ්)—විෂ බීජ නාශක ද්‍රව්‍ය ... ... | 50 | 0 |
| ඩී 1 (ජේ)—සෞඛ්‍ය සතිය සඳහා වියදම් ... ... | 50 | 0 |
| ඩී 1 (කේ)—කිරි වර්ග කිරීමේ වියදම් ... ... | 50 | 0 |
| ඊ 2—නඩත්තු කිරීම ... ... ... | 2,000 | 0 |
| | 5,076 | 0 |

| අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|
| ඒ 1 (ඩී)—කාර්යාල කාර්ය සහායකයෝ සහ පණිවුඩකරුවෝ | 600 | 0 |
| ඒ 2 (බී)—ගමන් ගාස්තු ... ... | 100 | 0 |
| ඒ 2 (ජී)—නීති උපදේශක ගාස්තු ... ... | 500 | 0 |
| ඒ 2 (කේ)—කාර්යාලයීය ලි බඩු හා උපකරණ ... | 100 | 0 |
| බී 12—අදත් වැඩ ... ... ... | 1,750 | 0 |
| සී 8—ජීවනාධාර දීමනා ... ... | 100 | 0 |
| ඩී 6 (බී)—නඩත්තු කිරීම ... ... | 1,000 | 0 |
| ඩී 7 (ඒ)—වේතන ... ... ... | 21 | 0 |
| ඊ 7—විනෝද බදු පරීක්ෂණය ... ... | 305 | 0 |
| ජේ 5—නඩත්තු කිරීම ... ... | 600 | 0 |
| | 5,076 | 0 |

දයා වී. පස්කුවිල්,
සභාපති,
සුළු නගර සභාව, මතුගම.

1965 අගෝස්තු 22 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්යාලයේ දිය.

### 1965 පළමුවන පරිපූරක වැය ලේඛනය

**1 වන කොටස—සාමාන්‍ය**

| වැය ශීර්ෂය | රු. | ශ. | අනුමතිය |
|---|---|---|---|
| සී—සනීපාරක්ෂාව :— | | | |
| (7) මෙළඳ පොළවල් සහ ගාල්—(සී)—ඉදිකිරීම ... ... | 30,000 | 0 | 1965.4.24 දින අංක 2 දරණ යෝජනාව |
| | 30,000 | 0 | |

දයා වී. පස්කුවිල්,
සභාපති,
සුළු නගර සභාව, මතුගම.

1965 අගෝස්තු 25 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්යාලයේ දිය.
9-101—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

## නිවරදි කිරීමයි

**මාවනැල්ල සුළු නගර සභාව**

1965 අයවැය කෙටුම්පත

1965 ජූලි 30 වැනි දින අංක 14,461 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ 557 වැනි පිටුවේ පළවී ඇති දැන්වීමේ ඕ (2) සී දරණ මාතෘකාව කෙලින් පළවී ඇති මුදල රු. 50 නොව රු. 500 ලෙස කියවිය යුතුයි.

සභාපති,
මාවනැල්ල සුළු නගර සභාව,
මාවනැල්ල.

1390/2—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## මහනුවර දිස්ත්‍රික්කයේ පා. දූ. පලිස්පත්තු බටහිර ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබද ආඥාපනත.

මෙහි පහත සදහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් 1965 වර්ෂයට මස් පිණිස මැරීමට හා මස්කඩ පවත්වා ගෙන යැමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන පාතදුම්බර පලිස්පත්තු බටහිර ගම්සභාව සීමාව තුළ පදිංචි යම කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබද ආඥාපනතේ 272 වැනි පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළදම | පිහිටි ස්ථානය |
|---|---|---|
| කේ. නාගූර්පිච්චි | එළ හරක් මස් | රෝටුකඩේ/මවුල්කැලේ. |

ඇම්. ජේ. බී. ඒකනායක,
පා. දූ. පලිස්පත්තු බටහිර ගම්සභාවේ සභාපති.

1965 අගෝස්තු මස 23 වෙනි දින,
දිගන, කෙන්ගල්ල.

9–232—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## දැන්වීමයි

1965 වර්ෂය තුලදී මස් වෙළදාම් කිරීමේ බලපත්‍රය සඳහා පහත දක්වෙන නම් සඳහන් අයවලුන් ඉල්ලුම කර ඇත.

මවිසින් නිකුත් කරන බලපත්‍ර අරබයා සෙට්ටිකුලම, බස්නාහිර සිත්න සෙට්ටිකුලම ගම්සභා, ප්‍රදේශාන්තරයේ පදිංචි යම අයෙක් විරුද්ධතාවය දක්වීමට අදහස් කරනු කැමත්තේ නම් ඔහුගේ හෝ ඇයගේ විරුද්ධතාවයට කාරනා, ගැසට් පත්‍රයේ සදහන් දින සිට දින 14 ක් ඇතුලතදී ලියවිල්ලෙන් ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් මාගේ අවධානය යොමු කෙරේ.

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | අවසරය |
|---|---|
| ඒ. නාගූර්කානි, මාන්කුලම්, චේරිකුලම්. | බස්නාහිර සිත්න සෙට්ටිකුලම ගම්සභාවේ එළු මස් හා හරක් මස් කඩය. |
| කේ. ඇම්. උමාර්, මස් වෙළදපොල, වව්නියා. | |

S. Philipiah,
ගම් සභාපති.

බස්නාහිර සිත්න සෙට්ටිකුලම,
ගම්කාර්‍ය සභාව.

9-205 —65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

## දැන්වීමයි

වගී 1957 අංක 59 දරණ විදුලිබල (සංශෝධන) පනතින් සංශෝධිත වගී 1950 අංක 19 දරණ විදුලිබල පනතේ 9 වැනි ඡේදය සහ ඒ යටතේ අංක 10,899 සහ 1956 මාර්තු 2 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසීන් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලය අනුව, වේයන්ගොඩ සුළු නගර සභාවට නිකුත් කර ඇති විදුලිය බලපත්‍රයේ (අ) උපලේඛනයේ සඳහන් විදුලිය සැපයීමේ බලයලත් ප්‍රදේශය දීර්ඝ කිරීම සම්බන්ධව ඉහත සඳහන් රෙගුලාසීන් යටතේ 1965 ඔක්තෝම්බර් මස 4 වැනි දින පස්වරු 3 ට වේයන්ගොඩ සුළු නගර සභා කාර්‍යාලයේදී විභාගයක් පවත්වන බව සියළුදෙනාටම මෙයින් දනුම් දෙනු ලැබේ.

දීර්ඝ කරන ලද ප්‍රදේශවල මායිම්

වේයන්ගොඩ සුළු නගර සභාවේ උතුරු සීමාවේ සිට බාදුරාගොඩ පාරේ දම්වැල් 32ක දුර ප්‍රමාණයක් සහ එම පාරේ මැද සිට බස්නාහිර දෙසට දම්වැල් 8ක සහ නැගෙනහිර දෙසට දම්වැල් 16ක ඇතුලත ප්‍රදේශ.

වේයන්ගොඩ සුළු නගර සභාවේ දකුණු සීමාවේ සිට දන්විලාන පාරේ දම්වැල් 28ක දුර ප්‍රමාණයක් සහ එම පාරේ මැද සිට බස්නාහිර දෙසට දම්වැල් 8ක සහ නැගෙනහිර දෙසට දම්වැල් 12ක ඇතුලත ප්‍රදේශ.

මෙම විභාගය සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියළුම පුද්ගලයින් පිටපත් තුනකින් සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්‍ෂක තැන, තැ. පෙ. 540, කොළඹ යන ලිපිනය සඳහන් ලිපිය 1965 සැප්තැම්බර් මස 20 වැනි දින පෙරවරු 10 ට පෙර විදුලිය පරීක්‍ෂකතුමාගේ කාර්යාලයට බාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කරුණු සම්බන්ධ වැඩිමනත් විස්තර මෙම දැන්වීමේ පළමුවැනි කොටසේ සඳහන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසීන් බලනු මැනවි.

ඩී. ආර්. සී. ද අල්විස්,
විදුලිය පරීක්‍ෂක.

ප්‍රධාන විදුලිය පරීක්‍ෂකතුමාගේ කාර්යාලය,
තැ. පෙ. 540, කොළඹ,
1965 අගෝස්තු මස 24 වැනි දින දී ය.

9–216—65.9.3 දින අංක 14,495 දරණ ගැසට් පත්‍රය.

---

**සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පල කරනු ලැබේ. ප්‍රසිධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පල කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පල කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ ඇත.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 50 | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 17 50 | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 25 0 | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිල රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් .. ... ... | 0 30 | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 60 | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 15 | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | 0 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපතක් විකිණීම බාර. කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි